# ළමයින්ගේ ලෝකයට සුභාෂිතය 01

ලෝකයට උපකාරයක් වන නැණ ගුණගෙයන් පිරිපුන් දරුවකු සතු විය යුතු පෞරුෂයක් වර්ධනය කළ හැකි මාර්ගොපදේශකයක් ලෙස රචිත රනස්ගල්ලේ හිමිපානන්ගේ ලෝකෝපකාරය නම් ග්‍රන්ථයේ සාහිත්‍යමය හා උපදේශනාත්මක ගුණය පිළිබඳව අපි පසුගිය ලිපියෙන් විමසා බැලූවෙමු. එම පද්‍ය සමූහය විචාරාත්මකව විමසා බලන කළ හුදෙක් ළමා ලෝකයට ආමන්ත්‍රණය කළත් කතුවර යතිවරයාණන් වහන්සේ එම උපදෙස් සමාජයේ වැඩිහිටියන් විසින් වැළඳ ගනු ලැබ තම බාල පරපුර වෙත බෙදා දිය යුතුදායාදයක් ලෙස සැළකූබව පෙනී යයි. තම දරුවන්ට තරම් දයාබර සෙනෙහසක් ලොව කවර දෙයකටවත් නොදක්වන දෙගුරුන් සාක්ෂාත් කරගත යුතු මහාර්ඝ වත්කම දරුවන් ආනන්දයෙන් හා ප්‍රඥාවෙන් ප්‍රානවත් කිරීම බව විද්වත් ලෝකය පුරා පැතිරී ගිය අපේක්ෂාවකි. එහෙයින් එවන් උපදේශ කාව්‍ය වැඩිහිටියන් වෙත පිරිනැමුණු සන්දේශ වැනි ය.

සිංහල ජාතිය පෘතුගීසි ලන්දේසි හා ඉංග්‍රීසි යන විදේශික ආක්‍රමණයන්ට යටත් වී ශත වර්ෂ හතරක් පමණ කාලයක් වල්මත්වීම හේතුකොටගෙන රට ජාතිය හා ආගමේ නව පුනර්ජීවනයක් සඳහා සාහිත්‍යකරණය ඔස්සේ නව මානයක් කෝට්ටේ යුගයේ සිට වර්ධනයවීම ජාතියේ වාසනාවකි. මිනිස් යුතුකම් හා වගකීම් පිළිබඳ දේශාභිමානයක් හා ජාතිවාත්සල්‍යයක් ඒ ඔස්සේ වර්ධනය වීම පුදුමයක් නොවේ. නොපමාව ජාතිය අධිරාජ්‍යවාදී බැමි වලින් නිදහස් කරගැනී මේ ජාතික අභිලාෂයන් දළුලා වැඩීමට එම සාහිත්‍ය ප්‍රබෝධය බලවත් වූ බවත් සිංහලෙන් කතා කිරීම දඩ ගැසුම් කෑමට පවා ලක් කළ අධ්‍යාපන සමයක නැවත සිංහල බස හා සාහිත්‍ය අභිමානය අනාගත පරපුර තුළ ජනිත කිරීමට එම පෙළඹවීම ප්‍රමුඛ වූ බවත් පෙනී යයි. කෝට්ටේ යුගම මෙරට සිංහල සාහිත්‍ය උදාවේ ස්වර්ණමය යුගය ලෙසට පත්වීමට තරම් නිර්මාණශීලීවීම මීට උදාහරණයකි.

සිංහල බෞද්ධ ජාතික ප්‍රබෝධය ජනතාව තුළ දල්වාලීම සඳහා ශ්‍රී ලාංකික පඬිවරුන් එදා හෙළි කල මග ඕස්ට්‍රේලියාවේ යුරෝපීය සංස්කෘතියේ ජීවත්වුවත් එම සිංහල සංස්කෘතියේ හර පද්ධතීන් ඇසුරු කිරීම අප විසින්ද අනුගමනය කැරනු ලැබිය යුතු මාහැගි පිළිවෙතක් විය යුතු බව හැඟී යයි. මන්ද අධ්‍යාපනය හෝ රැ කියාවක් සඳහා හෝ පැමිණ මෙහි ස්ථිර පදිංචි ය ලබා මෙහිදී අපට උපදින දරුවන් ඕස්ට්‍රේලියානුවන් ලෙස හුන්වා දෙන තත්වයකදී වුවත් සැබැවින්ම අප ශ්‍රී ලාංකිකයන් බව අමතක කළ නොහැකි බැවිනි. විශේෂයෙන් අපගේ දරු පරපුර අප සමග ජීවත් කරවීම සඳහා ඔවුන්ට අපේ කම ජනිත කිරීම අත්‍යවශ්‍ය බැවිනි. ඒ සඳහා ප්‍රධාන ප්‍රවේශය අපේ බස හා සාහිත්‍යය මෙන්ම අපගේ ආගමේ හර පද්ධතීන්ද ඔවුන් වෙත උරුම කර දිය යුතු බැවිනි.

භාෂා හා සාහිත්‍ය ප්‍රබෝධයේදී ජාති පුත්‍රයකුට හා දියණියකට සමාජමය වටිනාකම් ලබාදීම සඳහා පිලිපැදිය යුතු නීති සංග්‍රහයක් ලෙස උපදේශන කාව්‍ය නිර්මාණ අතීත භාරතීය සංස්කෘත බෞද්ධ හා ජෛන සාහිත්‍යය තුළ ගැඹුරින් රචනා වූ බව වාර්තා වේ. සමාජ ශික්ෂණයට මහෝපකාරී වූ නීති ශාස්ත්‍රයට අදාල සාහිත්‍ය විඹශ්ෂයක් මෙරට ව්‍යාප්ත වූයේ කෝට්ටේ යුගයේ පහල වූ වීදාගම මෛත්‍රී හිමිපාණන්ගේ ලෝ වැඩ සගරාවෙනි. එය ජීවිතයේ නිස්සාර බව මෙනෙහිකොට කුසල් ?ස්කර නිවන්සුව අත්පත් කරගැනීමේ අගය දැක් වූ ධර්ම ග්‍රන්ථයක් විය. එයින් පසුව රචනා වූ ශ්‍රෙෂ්ටතම සමාජ උප දේශණ ග්‍රන්ථය වන්නේ සීතාවක රාජසිංහ සමයෙහි අලගියවන්න මුකවෙටි තුමා විසින් රචිත සුභාෂිතයයි. මෙහි ජීවත්වන සිංහල දූ දරුවන්ට පමණක් නොව වැඩිහිටියන්ගේ ජීවනාලෝකයටද කෙතරම් ආභිර්වාදයක් සුභාෂිතයෙන් උදාවේදැයි විමසා බැලීම අපගේ අරමුණ වේ.

සුභාෂිතය යනු මනාකොට කියන ලද යන අරුත් දනවන පදයකි. මනාකොට කියන ලද් දේ කවරෙක්ද? එය යහපත් ජීවන් පැවැත්ම සඳහා වන කියවීමකි. සංස්කෘත ප්‍රිවරයකු දක්වා ඇති පරිදි මෙම ලෝකය විෂ සහිත වෘක්ෂයකි. එම ගසෙහි හටගත් අමෘත ඵල දෙකක් ඇත. එකක් නම් සුභාෂිත රසාස්වාදයයි. අනෙක සජ්ජන සංගමයයි. එනම් යහපත් මනුෂ්‍යයකු තුළ සදාචාර ශික්ෂණයක් සඳහා අවශ්‍ය රසාස්වාදය ප්‍රගුණ කළ යුතු අතර පුද්ගල සහජීවනය සඳහා ප්‍රගතිශීලී සමාජ ඇසුරක්ද එකසේ වැඩිය යුතු බවය. ලෝකෝපකාරය මෙන්ම සුභාසිතයද එම අරමුණ ඉටුකර ගැනීමේදී පැරණි සමාජයට පහළ වූ කප්රුක් බඳු විය. පොදුජන ජීවිතය හා බැඳුණ ප්‍රකට දෘෂ්ටාන්ත හා උපමා රාශියකින් සුභාෂිතය පොහොසත් ය.

රාජ්‍ය පාලන යසත් පුරුෂ ඇසුර මහාත්ම ගති පැවතුම් පරාර්ථ චර්යාව ධනාත්මක ආකල්ප ආදියෙහි වර්ධනය මගින් පොදුජන සුබ සිද්ධිය නංවාලීමෙහි ලා එය ප්‍රබල අත්වැලක් විය. මෑතක් වනතුරු බාල පරපුරෙහි ශික්ෂණය සඳහා මෙන්ම භාෂා සාහිත්‍ය රස වර්ධනය සඳහාද ඉන් ලද පිටුවහල සුලුපටු නොවේ. එවැනි ග්‍රන්ථ වන පොත් කිරීමේ ක්‍රමවේදයක්ද අතීතයේ පැ වතුණි. නූතන තාක්ෂණවේද මගින් මෙවැනි ජීවන හර පද්ධති ඉවත්වී යාමේ පල විපාක අපට දැනෙන්නට පටන්ගෙන තිබේ. සිංහල සමාජ ක්‍රමයෙන් ක්‍රමයෙන් ඈත්වෙමින් මෙරට ජීවත්වන අප සිංහල දූ දරුවන්ට එවැනි දායාද ජනිතකිරීම මහෝපකාරී වේ යයි පෙනී යයි. පද්‍ය 100 කින් සමන්විත සුභාෂිතය පද්‍ය 1 සිට 16 දක්වා පින්කිරීමට හා නිවන්පුරට යාම පිළිබඳ ප්‍රාර්ථනා කාව්‍ය සමුදායකින් යුක්ත වේ. පද්‍ය නිර්මාණ අතර එදා මෙන්ම අදටත් විද්වතුන් අතර ප්‍රක ටව පරිශීලනය වන උපදේශ කාව්‍ය 25 ක් තෝරා කෙරෙන මෙම විග්‍රහයෙන් සුභාෂිතය විමසා බලමු.

**මතු සම්බන්ධයි.**



**විජේරත්න පතිරාජ**
කථිකාචාර්ය
කොළඹ විශ්ව විද්‍යාලය
ශ්‍රීපාලි මණ්ඩපය




# ප්‍රහෙලිකාව

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ■ | 1 ප | 2 | 3 | ■ | 4 ම | ■ | ■ |
| 5 | | ව | | 6 දෙ | | 7 ර | 8 |
| ■ | 9 පු | | ■ | | ■ | 10 | |
| 11 | | ක | ■ | 12 ව | | | |
| ■ | ■ | 13 | 14 ක | | ■ | 15 | ර |
| 16 සු | 17 | ■ | 18 | | 19 ය | ■ | |
| 20 | | | ක | | | ■ | |
| 21 | ර | ■ | 22 | | ■ | 23 | බ |

## හරහට

1. අඩුව නැතහොත් වියැකි
5. සුමිත්ත ගේ පුත්‍රයාය
9. දිලීර
10. ආසන්න හෙවත් මඳ
11. දේශීය වෙදකමේ ඖෂධ වර්ගයකි
12. කැලෑරොදක යන්න මෙසේ ද කිව හැක
13. ලස්සන
15. දිගමැනීමේ ඒකකයකි
16. සතුටු සැප
18. රෝදය
20. සාහිත්‍යාංගයකි
21. මහත
22. හඳුනාගැනීමේ ප්‍රහලම සලකුණයි
23. රසකාරකයකි

## පහලට

1. සක්දෙවිඳුන් ගේ අසුන
2. සැන්දෑව
3. මේවා වදිනවට කිසි වෙකු කැමති නැත
4. පූජනීය කාණ්තාවකි
6. විශ්ව සාහිත්‍ය කෘතියක සිංහල පරිවර්තනයයි
7. වැඩවසම් යුගයේ ප්‍රභලයෙකි
8. ලෝක ඉතිහාසය වෙනස් කල නිපැයුමකි
14. එක්තරා සන්නිවේදකයෙකි
16. මනා ලෙස ජනිත වූ
17. කාන්තාරය
19. දුෂ්කර ආහාරයක් ලෙස සැලකේ

## මැයි කළාපයට අදාල ප්‍රහෙලිකාවෙහි පිළිතුරු

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 සි | ං | හා | 2 ව | ලෝ | ක | 3 න | 4 ය |
| රි | ■ | ■ | න | ■ | ■ | 5 ර | න් |
| 6 මා | 7 ළි | ග | ය | ■ | 8 ම | සි | ත |
| ■ | ඳ | ■ | ■ | 9 අ | න් | ත | රේ |
| 10 අ | ල | 11 ය | ■ | ■ | දා | ■ | ■ |
| 12 ග | ග | ව | 13 ට | කෝ | ර | 14 ල | 15 ය |
| හි | ■ | 16 හ | ක | ■ | 17 ම | හි | ම |
| 18 ග | ම | න් | ය | න | ■ | රු | ■ |

DOCUMENT TRANSLATIONS WITHIN A DAY
SWORN TRANSLATIONS • NAATI TRANSLATIONS
ඕනෑම භාෂාවකට අයත් ලේඛණයක්
සීඝ්‍රගාමී පරිවර්තනය සඳහා
අප අමතන්න
03 9792 9977
සඳුදා සිට සිකුරදා දක්වා
පෙ.ව 9.00 - ප.ව 5.00 දක්වා විවෘතයි.
1/44 King Street Dandenong VIC 3175
WARNALEGAL
Justice for all
03 9701 3718 info@warnalegal.com warnalegal1

RESIDENTIAL DESIGNS, PERMITS DRAWINGS
RANJ DESIGN & DRAFTING SERVICES
RANJITH WANNINAYAKE
- FREE ADVICES
- PLANS–SINGLE/DOUBLE STOREY/ EXTENSIONS/DECKS/CARPORTS
- PLANNING PERMIT DRAWINGS
- BUILDING PERMIT DRAWINGS

REGISTERED Building Practitioner
bdav
3/19 Balmain Court, Lalor 3075
Tel: 0430 066 241 Email: designrake@gmail.com